# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 712 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 26/04/2024<br>පැය 0540 |

## මාධ්‍ය නිවේදනය

**01. නීති විරෝධී ලෙස කොටස් එකලස් කර සකස් කරන ලද යතුරුපැදි ව්‍යාජ ලිපි ලේඛණ සකසා අළෙවි කල ස්ථාන 03ක් වැටලීම - පානදුර වලාන දූෂණ මර්ධන ප්‍රහාරක ඒකකය.**

කුරුණෑගල, වාරියපොල හා මාස්පොත ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් විදේශයන්හි සිට ආනයනය කරනු ලබන යතුරුපැදි අමතර කොටස් යොදා ගනිමින් එකලස් කරනු ලබන යතුරුපැදි නීති විරෝධි ලෙස ව්‍යාජ ලිපිලේඛණ සකස් කර අළෙවි කර රජයට හිමි විය යුතු බදු මුදල් අහිමි කරමින් පවත්වා ගෙන ගිය යතුරුපැදි අලෙවි කරනු ලබන ස්ථාන 03 ක් සම්බන්ධයෙන් පානදුර වලාන දූෂණ මර්ධන ප්‍රහාරක ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත 2024.04.25 වන දින වැටලීමක් සිදුකර කෝටි දෙකකට ආසන්න වටිනාකමකින් යුත් 48CC හා මොවැඩ් වර්ගයේ යතුරුපැදි 41 ක් අත්අඩංගුවට ගෙන ඇත.

එම මධ්‍යස්ථානවල හිමිකරුවන්ගෙන් සිදුකරන ලද ප්‍රශ්න කිරීම් වලදී මෙම යතුරුපැදි කුරුණෑගල ප්‍රදේශයේ වාහන අමතර කොටස් ආනයන කරනු ලබන ව්‍යාපාරිකයෙකු විසින් යතුරුපැදි අමතර කොටස් ලෙස ගෙන්වා එකලස් කර මෙම අළෙවි මධ්‍යස්ථාන වෙත විකුණා ඇති බවට කරුණු අනාවරණය වී ඇත.

අත්අඩංගුවට ගත් යතුරුපැදි 41 වැඩිදුර විමර්ශන කටයුතු සඳහා එම අළෙවි මධ්‍යස්ථාන අයත් වාරියපොල හා කුරුණෑගල පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත. මෙම ආයතන වලින් මිලදී ගත් යතුරුපැදි ලියාපදිංචි කර ගැනීමට නොහැකි බවද ගැණුම්කරුවන් විසින් පෙන්වා දී ඇත. මෙම ජාවාරම සම්බන්ධයෙන් වාරියපොල හා කුරුණෑගල පොලිසි විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මනුෂ්‍ය ඝාතනයකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - යාපනය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය.**

යාපනය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් 2024.03.11 වන දින රාත්‍රී කාලයේදී වඩුක්කෝට්ටෙ පොලිස් වසමේ පොන්නාලේ හන්දිය ප්‍රදේශයේදී පුද්ගලයන් පිරිසක් විසින් අඹුසැමි යුවලක් පැහැරගෙන ගොස් පිරිමි පුද්ගලයාට තියුණු ආයුධවලින් පහරදී ඝාතනය කිරීමේ අපරාධයට අදාල අවශ්‍ය කර සිටි සැකකරුවෙකු 2024.04.25 වන දින කරෙයිනගර් ආලන්කන්ඩ ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන යාපනය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 30 ක් වූ කරෙයිනගර් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

යාපනය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය.**

2024.04.25 වන දින දහවල් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ස්වෛස්පුර ප්‍රදේශයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 මිලි ග්‍රෑම් 280 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන ග්‍රෑන්ඩ්පාස්, කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.04.25 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ වටරප්පල ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 200 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වන ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. නීති විරෝධී මත්පැන් පෙරීමට ගන්නා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - රස්නායකපුර පොලිස් ස්ථානය.**

2024.04.25 වන දින දහවල් කාලයේ රස්නායකපුර පොලිස් වසමේ කුරුවිලම ප්‍රදේශයේදී රස්නායකපුර පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින්

වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට ගන්නා ගෝඩා ලීටර් 1110 ක් (බැරල් 06) ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 50 ක් වන කඩිගාව, නිකවැරටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රස්නායකපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. ගව සොරකමේ පැමිණි බවට සැකකරන වෑන් රථයක් හා මෙරට නිෂ්පාදිත ගිනි අවියක් අත්අඩංගුවට - උඩුගම පොලිස් ස්ථානය.**

2024.04.25 වන දින අලුයම් කාලයේදී උඩුගම පොලිස් වසමේ අලුත්වත්ත ප්‍රදේශයේදී උඩුගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ගවයින් සොරකම් කිරීම සඳහා පිරිසක් වෑන් රථයකින් පැමිණ සිටින බවට ලද තොරතුරක් අනුව වැටලීමක් සිදුකිරීමේදී සැකකරුවන් වෑන් රථය දමා පලා ගොස් ඇති අතර එම වෑන් රථය පරික්ෂා කිරීමේදී **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** හා ටී 56 වර්ගයේ ජීව උණ්ඩයක් සොයා ගෙන ඇත.

වෑන් රථය හා ගිනි අවිය අත් අඩංගුවට ගෙන ඇති අතර පලාගිය සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා උඩුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - අඹන්පොල පොලිස් ස්ථානය.**

2024.04.25 වන දින සවස් කාලයේදී අඹන්පොල පොලිස් වසමේ කොතලකෙමියාව ප්‍රදේශයේදී අඹන්පොල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් අනුව වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 55 ක්වූ කොතලකෙමියාව, මහව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අඹන්පොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**